GMOA
ESTABLISHED IN 1926
TU No. 291
THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07
Tel : 2580886 / 0714 999555
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk

2014/09/22

**මාධ්‍ය නිවේදනයයි**

කිරි පිටි පිළිබඳ වෙලඳ දැන්වීම් මාධ්‍ය හරහා ප්‍රචාරන තාවකාලිකව අත්හිටුවීමට සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක ජනරාල්වරයා තිරණය කර ඇති බවට ඊයේ මාධ්‍ය ඔස්සේ වාර්ථා පල විය. මෙය ඉතාම ගුණාත්මක හා කාලෝචිත ක්‍රියාවක් ලෙස අගය කරමු.

අප සංගමය මේ පිළිබඳව අදාල බලධාරින්ගේ අවධානය යොමු කරන ලද්දේ මීට වසරකටත් පෙර සිටය. ආනයනික කිරි පිටි වල විෂ රසායනික ද්‍රව්‍ය අඩංගු බවට ITI ආයතනය වාර්ථා නිකුත් කල අවස්ථාවේ අප සංගමය විසින් ජනතාව හා බලධාරින් දැනුවත් කිරීමට දැවැන්ත වැඩ පිළිවෙලක් දියත් කරන ලදි.

එහිදී සුරක්ෂිත ආහාර පිළිබඳ දස වැදෑරුම් යෝජනාමාලාවක්ද අප විසින් ඉදිරිපත් කරන ලදි. එම යෝජනා වලින් වැඩි ප්‍රමාණයක් 2014 රජයේ අය වැය යෝජනා තුල පිළබිඹු විය. ප්‍රමාද වී හෝ එම යෝජනා ක්‍රියාත්මක වීමට ආරම්භ වීම සතුටට කරුණකි.

කිරි යනු පෝෂණ ගුණය අතින් වැදගත් ආහාරයක් වුවත් ගෘහ ආර්ථිකය තුල ඒ සඳහා අනවශ්‍ය ප්‍රමුඛතාවයක් ලැබී ඇති බවට හෙලිදරව් වී ඇත. සහල් හැරුණු කොට නිවසක් තුල වැඩිම පිරිවැයක් සිදු කරනුයේ කිරි පිටි වලට බව සමීක්ෂණ තුලින් හෙලිදරව් වී ඇත. කිරි සඳහා ලැබෙන මෙම අනිසි ප්‍රමුඛතාවය පෝෂණ ගැටළු රැසකට පාදක වී තිබේ.

අනෙක් අතට රටක් වශයෙන් ශ්‍රී ලංකාව ලෝකයේ ප්‍රධානතම කිරි පිටි ආනයන කරුවෙකු බවට පත්වී ඇත. මෙය ජාතික ආර්ථිකයට අති විශාල පීඩනයක් බවට පැහැදිලිය.

පෝෂණ ගුණය අතින් ගත් කල ස්වාභාවික දියර කිරි පිටි කිරි වලට වඩා පෝෂණ ගුණයෙන් ඉතා ඉහලය. එසේ නම් සිදු කල යුත්තේ දේශිය දියර කිරි නිෂ්පාදනය දිරි ගන්වමින් ජනතාව දියර කිරි භාවිතයට හුරු කරවීමය.

ශ්‍රී ලංකාවේ ආහාර අධිකාරිය මෙම කටයුත්තෙන් නොනැවති සුරක්ෂිත ආහාර ජනතාවට ලැබීමට පහත අංශ කෙරෙහි අවධානය යොමු කරනු ඇතැයි අපි බලාපොරොත්තු වෙමු.

- කෘතිම රසකාරක.
- ක්ෂණික ආහාර.
- ශක්ති ජනක පාන.

ජනතාවගේ සෞඛ්‍යට අහිතකර ඉහත සියලු ආහාර වර්ග පිළිබඳ ප්‍රචාරණ කටයුතු ඉතාම ප්‍රබල අන්දමින් සිදු වෙමින් පවතී. විශේෂයෙන්ම පාසල් ලමුන් ඉලක්ක කර ගනිමින් එම ප්‍රචාරණ මාධ්‍ය තුල පමණක් නොව, ක්‍රීඩා තරඟ වැනි අවස්ථාවල පාසල් භූමිය තුලද සිදුවේ.

මේ පිළිබඳව සෞඛ්‍ය අමාත්‍යාංශය පමණක් නොව අධ්‍යාපන අමාත්‍යාංශයද අවධානය යොමු කරනු ඇතැයි අපි බලාපොරොත්තු වෙමු.

ස්තූතියි,

වෛද්‍ය ලසන්ත පිනදාස
ලේකම්

| | | |
|---|---|---|
| වැඩිදුර විස්තර සඳහා : | වෛද්‍ය නලින්ද හේරත් | - 0773495821 |
| | වෛද්‍ය තිමති වික්‍රමසේකර | - 0772003062 |
| | වෛද්‍ය හරිත අළුත්ගේ | - 0718121619 |